**තණමල්විල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 28 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට තණමල්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ප්‍රාදේශීය සභාවට අයත් සුසානභූමි 95 ක සහ මොරකැටිය හන්දියේ පිහිටි කඩකාමර සහිත ඉඩම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | තක්සේරු කර ගිණුම්ගත කළ යුතුවේ. | 2017 වර්ෂයේ සිදු කරන ලද සමීක්ෂණයකින් හඳුනාගත් සුසානභූමිවල අයිතිය පවරා ගැනීමට පළාත් පාලන කොමසාරිස්වරයා මගින් අදාල ඉඩම් බලධාරීන් වෙත ඉල්ලීම් ඉදිරිපත්කර ඇත. මොරකැටිය හංදිය කඩකාමර අයිතිය සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් මතුවී ඇති අතර එය නිරාකරණය කර ගැනීමට සෙවනගල ප්‍රාදේශීය ලේකම්වරයා සමඟ කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු.85,685 ක් වටිනා කාර්යාල උපකරණ ගිණුම්ගතකර නොතිබුණි. | මිලදීගත් කාර්යාල උපකරණවල වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදි මෙම දේපළ වටිනාකම් ගිණුම්ගත කරමි. |

| | | |
|---|---|---|
| (iii) තාවකාලික තක්සේරුව අනුව සෙවනගල ප්‍රාදේශීය සභා උපකාර්යාල ගොඩනැගිල්ලේ වටිනාකම රු.8,280,000 ක් වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල එහි වටිනාකම රු. 828,000 ක් ලෙස රු.7,452,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදි මෙම දේපළ වටිනාකම් ගිණුම්ගත කරමි. |

**(ආ)** <u>**විගණනය සඳහා සාක්ෂි නොවීම්**</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 1,675,403,002 ක් වූ වත්කම් විෂයයන් 3 කට අදාළව අයිතිය තහවුරු කිරීමේ ලියකියවිලි හා විධිමත් ස්ථාවර වත්කම් ලේඛන ඉදිරිපත් නොකිරීම | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | අයිතිය තහවුරු කරගැනීම සඳහා අදාල ආයතනවලට ඉල්ලීම්කර ඇති අතර, මේවන විට දේපළ 4 ක් සම්බන්ධයෙන් භුක්තිය භාරදීම් ලැබී ඇත. අයිතිය ලැබෙන සෑම දේපලක් සඳහාම ඒ අවස්ථාවේම ලේඛනගත කරන අතර ලේඛනගත කර නොමැති යන්ත්‍ර හා උපකරණ තක්සේරු කර ලේඛනගත කරමි. ලී බඩු හා සවිකිරීම් සම්බන්ධයෙන් කමිටුවක් පත් කොට ලබා ගන්නා වාර්තාව අනුව ලේඛනගත කිරීමට කටයුතු කරමි. |

**1.4** <u>**අනුකූල නොවීම**</u>

<u>**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**</u>

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** <u>**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**</u><br>147 (i) වගන්තිය | ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එම මණ්ඩලය අනුමතකර ඇති ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ තිබෙන හෝටල් සහ | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මෙහි සඳහන් කර ඇති වගන්තියෙහි විධිවිධාන | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් සම්බන්ධයෙන් සංචාරක මණ්ඩලයෙන් වාර්තාවක් ලබාගෙන බදු අයකරමි. |

| | | | |
|---|---|---|---|
| | නවාතැන්පොළ පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** xxiv පරිච්ඡේදයේ 4 වගන්තිය | 2014 වර්ෂයට පෙර සිට පැවත එන සේවකයන් 16 ක ගෙන් අයවිය යුතු රු.103,689 ක සේවක ණය අයකරගෙන නොතිබුණි. | අය විය යුතු සේවක ණය අයකරගත යුතුවේ. | පැරණි හිඟ සේවක ණය සම්බන්ධයෙන් අදාල වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමට අදාල නිලධාරියාට නියෝග කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,363,166 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 16,231,264 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 60,000 | 35,000 | 35,000 | - | 60,000 | 51,620 | 51,620 | - |
| (ii) | කුලී | 14,197,600 | 14,082,261 | 13,648,561 | 433,700 | 11,626,300 | 11,627,700 | 11,564,600 | 63,100 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,697,715 | 2,031,502 | 2,031,502 | - | 1,426,523 | 1,718,949 | 1,718,949 | - |
| (iv) | වෙනත් ආදායම් | 16,627,443 | 17,032,249 | 4,201,336 | 12,830,913 | 13,292,038 | 22,468,761 | 10,506,206 | 11,962,554 |
| | එකතුව | 32,582,758 | 33,181,012 | 19,916,399 | 13,264,613 | 26,404,861 | 35,867,030 | 23,841,375 | 12,025,654 |

**2.2.2** <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු. 33,181,012 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු. 13,264,613 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල්කල ආදායමෙන් සියයට 34 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | 2018 වර්ෂයේ හිඟහිටි කුලී මේවන විට අයවී ඇත. වෙනත් ආදායම් වශයෙන් හිඟහිට ඇති රු.12,830,913 ක මුදලින් මේවන විට රු. 8,333,711 ක් අයවී ඇත. |

**2.2.3** <u>වරිපනම් හා බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකිරීමට කටයුතුකර නොතිබුණි. | දියුණු කළ ප්‍රදේශ කලින් කළ හඳුනාගෙන අදාල ක්‍රියාමාර්ග අනුගමනය කර වරිපනම් අයකළ යුතුවේ. | අදාල ප්‍රදේශය සිතියම්ගත කිරීම සම්බන්ධයෙන් මොනරාගල සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ සහය ඉල්ලා සිටින බව දන්වමි. |

**2.2.4** <u>වාහන කුලියට දීමේ ආදායම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් කම්පන තලනය, මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය සහ ටිපර් රථය කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 1,276,072 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ කුලී අයකර ගත යුතුවේ. | අයවී නොමැති සියළු මුදල් අයකර ගැනීම සඳහා නඩු පැවරීමට කටයුතු කරන බව දන්වමි. |

**2.2.5** <u>ජල ගාස්තු ආදායම් අයකිරීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ජල ගාස්තු ආදායම රු. 666,845 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ජල ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ මුදලින් රු.396,855ක් අයවී ඇත. |

**2.2.6** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 11,030,897 ක උසාවි දඩ සහ රු. 11,252,057 ක මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි. | හිඟ උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තුවලින් රු.7,663,946 ක් අය වී ඇත. ඉතිරි මුදල ඉක්මනින් ලබා ගැනීමට කටයුතු කරමි. |

**2.3** <u>අධිභාර</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුළ පැනවූ අධිභාර වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු. 87,749 ක මුදලක් අයකරගත යුතුව පැවතුණි. | අධිභාර මුදල් අයකරගත යුතුවේ. | මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම පළාත් පාලන කොමසාරිස්තුමා සතුවේ. |

**3.** <u>**මෙහෙයුම් සමාලෝචනය**</u>

**3.1** <u>**කාර්ය සාධනය**</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** <u>**ක්‍රියාකාරී සැලැස්ම**</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණු අතර ඒ අනුව වර්ෂයේ ළඟාකර ගැනීමට අවශ්‍ය අරමුණු සහ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් හඳුනාගෙන නොතිබුණි. එම නිසා වාර්ෂික කාර්යසාධනය ඇගයීමේ හැකියාව අහිමිවී ගොස් තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | 2020 වර්ෂයේදී සකස් කරමි. |

**(ආ)** <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතින්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට පුහුණු වැඩසටහනක් සංවිධානය කරමි. |

**3.2** <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවට අයත් නොවන පෞද්ගලික ගොඩනැගිලිවල සභාවේ සේවකයන් නොවන අයට පවත්වාගෙන යාම සඳහා පුස්තකාල 15 කට ලබාදී තිබුණු රු.552,437ක් වටිනා පොත් 3050ක් හා රු.210,000ක් වටිනා පොත් රාක්ක 28ක් ආපසු සභාවට ලබා ගැනීමට කටයුතුකර නොතිබුණි. එමෙන්ම මෙම පුස්තකාල දැනට ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. | පුස්තකාල ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී පුස්තකාල ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට කටයුතු කරමි. |

**3.3** <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| <u>කාර්ය මණ්ඩල පුරප්පාඩු</u><br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය අනුව සභාවේ තනතුරු 6 කට අදාලව පැවති සේවක පුරප්පාඩු 9 ක් විය. | කාර්යමණ්ඩලයේ පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | මෙම තනතුරු පිරවීම සම්බන්ධයෙන් වගකීම ඇත්තේ ඌව පළාතේ පළාත්පාලන අමාත්‍යාංශයටය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව භාවිතයට ගන්නා වාහන 02ක නීත්‍යානුකුල අයිතිය පවරාගෙන නොතිබුණි. | වාහනවල අයිතිය සභාවට පවරාගත යුතුවේ. | එක් වාහනයක් සභාවට පවරාදෙන ලෙස ඉල්ලීම්කර ඇති අතර, තවත් වාහනයක අයිතිය මෙම වර්ෂය තුල පවරා ගැනීමට කටයුතු කරමි. |

**3.5 ප්‍රසම්පාදනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | අනුමත වාර්ෂික අයවැය ලේඛනයට අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | අයවැය ලේඛනය පිළියෙල කිරීමේදී ප්‍රසම්පාදන සැලැස්මක් ඇතුලත් කරන බව දන්වමි. |

**3.6 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව විසින් ඝන මීටර් 200 කට වැඩි ප්‍රමාණයක බොරළු යොදා සංවර්ධනය කළ මාර්ග ව්‍යාපෘති 12 කට අදාලව ප්‍රවාහන විෂයය සඳහා ගෙවීම් කිරීමේදී බොරළු ඝන මීටර් 200 කට වැඩි ප්‍රමාණයේ ගෙවීම් ප්‍රමාණ රේට යොදා නොගෙන ඝන මීටර් 200 ට අඩු රේට යොදාගෙන ගෙවීම් කිරීම නිසා රු. 2,035,684 ක් වැඩිපුර ගෙවා තිබුණි. | සභා අරමුදලට සිදුවී ඇති පාඩුව නැවත අයකර ගත යුතුවේ. | මෙම කාරණය සම්බන්ධයෙන් ඌව පළාතේ පළාත්පාලන කොමසාරිස් තුමා වෙතින් තාක්ෂණ උපදෙස් ඉල්ලා සිටි අතර, එතුමා විසින් පත්කරන ලද ඉංජිනේරු කමිටුවක් මඟින් තාක්ෂණ වාර්තාවක් ලබා දීමට නියමිතව ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සභාව කුලියට ලබාගත් බැකෝ ලෝඩර් යන්ත්‍ර 2ක් යොදාගෙන සිදුකර තිබුණු සුසාන භූමි 4ක් පිළිසකර කිරීමේ කර්මාන්තවලදී එම බැකෝ ලෝඩර් යන්ත්‍ර 2 සඳහා නියමිත පැය ගණනට වඩා පැය 40.9 ක් | සභා අරමුදලට සිදුවී ඇති පාඩුව නැවත අයකර ගත යුතුවේ. | මෙම කාරණය සම්බන්ධයෙන් ඌව පළාතේ පළාත්පාලන කොමසාරිස් තුමා වෙතින් තාක්ෂණ උපදෙස් ඉල්ලා සිටි අතර, එතුමා විසින් පත්කරන ලද ඉංජිනේරු කමිටුවක් මඟින් තාක්ෂණ වාර්තාවක් ලබා දීමට නියමිතව ඇත. |

| | | | |
|---|---|---|---|
| | සඳහා රු. 96,240 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ඇ) | සභාව විසින් ඉටුකර තිබුණු මාර්ග කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘති 3 කට අදාලව ප්‍රමාණ පත්‍රය හා නිමිවැඩ වාර්තාව අනුව මාර්ගයේ උස අඟල් 6 ක් විය යුතු වුවද මාර්ගය භෞතික පරීක්ෂාවේදී එහි උස අඟල් 5ක් වූ බැවින් එකතුව රු. 407,494 ක් වැඩිපුර ගෙවා තිබුණි. මේ හේතුවෙන් මාර්ගය අපේක්ෂිත තත්ත්වයෙන් ඉදිකර නොමැති බවද නිරීක්ෂණය විය. | සභා අරමුදලට සිදුවී ඇති පාඩුව නැවත අයකර ගත යුතුවේ. | මෙම කාරණය සම්බන්ධයෙන් ඌව පළාතේ පළාත්පාලන කොමසාරිස් තුමා වෙතින් තාක්ෂණ උපදෙස් ඉල්ලා සිටි අතර, එතුමා විසින් පත්කරන ලද ඉංජිනේරු කමිටුවක් මගින් තාක්ෂණ වාර්තාවක් ලබා දීමට නියමිතව ඇත. |
| (ඈ) | සභාව විසින් ඉටුකර තිබුණු මාර්ග කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘති 3 කට අදාලව ඉටුකර නොතිබුණු ප්‍රසාරණ මූට්ටු (Span Joint) වැඩ විෂයය වෙනුවෙන් එකතුව රු. 20,832 ක් ගෙවා තිබුණි. | සභා අරමුදලට සිදුවී ඇති පාඩුව නැවත අයකර ගත යුතුවේ. | මෙම කාරණය සම්බන්ධයෙන් ඌව පළාතේ පළාත්පාලන කොමසාරිස් තුමා වෙතින් තාක්ෂණ උපදෙස් ඉල්ලා සිටි අතර, එතුමා විසින් පත්කරන ලද ඉංජිනේරු කමිටුවක් මගින් තාක්ෂණ වාර්තාවක් ලබා දීමට නියමිතව ඇත. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 4 ක සියයට 20 සිට සියයට 42 දක්වාද වියදම් විෂයයන් 6 ක සියයට 14 සිට සියයට 931 දක්වාද විචලනයන් පැවතුණි. | තාත්වික අයවැය ලේඛනයක් පිළියෙල කර එහි දක්වා ඇති ඉලක්ක සපුරාගත යුතුවේ. | 2019 වර්ෂයේ අයවැය විචලනයන් අවම කරගෙන මනා අයවැය පාලනයක් පවත්වා ගෙන යාමට කටයුතු කරමි. |

**4.2** <u>අභ්‍යන්තර විගණනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | අභ්‍යන්තර විගණන වරයෙකු පත්කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**4.3** <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක ඩීඑම්ජ්/ 2009 (01) දරන 2009 ජුනි 9 දිනැති අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි. | සභාව තුල විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවිය යුතුවේ. | මොනරාගල සහකාර පළාත් පාලන කොමසාරිස් සමඟ සාකච්ඡාකර විගණන හා කළමනාකරණ කමිටුවක් පත් කිරීමට කටයුතු කරමි. |